**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

**නීතිවේදී උපාධි පාඨමාලාව – 6 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය – 2008**

**නීති විද්‍යාව – LWU 4321 / 4311 / 3321**

**කාලය – පැය තුනයි**

---

**දිනය : 2008.04.10** **වේලාව: පෙ. ව. 09.30 – ප. ව. 12.30**

---

ප්‍රශ්න <u>හතරකට</u> පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

(1) නීතිය යනු කුමක්ද? නීතියෙහි ගුණාංග නිවැරදි ලෙස පෙන්වාදීමට නීතිවිද්‍යාවෙහි විවිධ ගුරුකුලයන්ට අයත් නීතිවේදීන් කාලාන්තරයක් තිස්සේ උත්සාහ ගනු ලැබුවද, ඔවුන් කිසිවෙකුත් ඒ සම්බන්ධව නිශ්චිත අර්ථනිරූපණයක් ඉදිරිපත් කිරීමට සමත් වී නැත. සියලු නීතිවේදීන්ගේ මතවාදයන්හි ධනාත්මක මෙන්ම සෘණාත්මක ලක්ෂණයන් අඩුවැඩි වශයෙන් අන්තර්ගත වේ. කෙසේනමුත් මෙකී මතවාදයන් එකිනෙක අතර පරස්පරයක් පැවතුනද, ඒවායින් සැහෙන ප්‍රමාණයක් නිසැක වශයෙන්ම නීතියෙහි වර්ධනයට දායක වී ඇත.

සාකච්ජා කරන්න.

(2) "නූතන ස්වභාවික නීති චින්තකයන්ගේ මතවාදයන්හි විෂමතා මෙන්ම සමාන ලක්ෂණද පොදුවේ ගැබ්ව පවතී. එහිදී නීතියෙහි දැඩිබව දුරුකරලීමට උත්සාහ දැරීම පොදු ලක්ෂණයක් වන අතර ස්වභාවික අයිතීන් පිළිබඳව මෙන්ම පුද්ගලයන්ගේ ආවේණික ස්වභාවයද අවධාරණයට ලක්කෙරේ."

නීතියෙහි ස්වභාවය හඳුනාගැනීම සම්බන්ධයෙන් ස්වභාවික නීතිවිද්‍යා න්‍යායෙහි ප්‍රායෝගික ප්‍රයෝජනවත්භාවය පැහැදිලි කරදෙමින් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය සාකච්ජා කරන්න.

(3) (අ) නීතිය වූකලි දඬුවමකින් බලාත්මක කල හැකි ස්වාධිපත්‍යයාගේ ආඥාවක් ලෙස විස්තර කරනු ලබන සිද්ධාන්තයේ ප්‍රබලතාවයන් හා දුබලතාවයන් ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුලින් ලබාගත් සුදුසු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 13)

(ආ) "ප්‍රත්‍යක්ෂ" නීතිය ("positive law") යන පදයට පහත සදහන් ඒවායෙන් කවරක් අන්තර්ගත වේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(i) සවස හයෙන් පසුව විශ්ව විද්‍යාල පරිශ්‍රය සිසුන්හට තහනම් ප්‍රදේශයක් බවට පත්කරමින් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයක උප කුලපති විසින් නිකුත් කරනු ලැබූ නියෝගයක්.
(ලකුණු 03)

(ii) පොදු ස්ථානවල දුම්බීම වරදක් බවට පත් කරනු ලබන පළාත් සභා අනු නීතියක්. (ලකුණු 03)

(iii) ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීතියෙහි ප්‍රතිපාදනයක්. (ලකුණු 03)

(iv) අන්තර්ජාතික නීතියේ රීතියක්. (ලකුණු 03)

(4) "වර්තමානයේ යම් යම් වැදගත් සීමාවන්ට යටත්වන බව පෙනී ගියද, නූතන නීති විද්‍යාවේ වර්ධනය කෙරෙහි විශේෂිත බලපෑමක් කරනු ලැබූ ඉතාසුවිශේෂී නීති න්‍යායක් හාන්ස් කෙල්සන් (1881-1973) විසින් ඉදිරිපත් කරන ලදි..."[*"TEXTBOOK ON JURISPRUDENCE" by H. McCoubrey & N.D. White. Page – 131.]*

අදහස් දක්වන්න.

(5) "...නීතිය වූකලි ආර්ථිකය පාලනය කල අය විසින් ජනතාව යටපත් කර තැබීමට භාවිතා කරන ලද මෙවලමකි. කම්කරු පංතියේ ආඥාදායකත්වය පිහිටුවීමෙන් පසුව වුවද, සුළුතර ධනපතීන් යටපත් කර ඔවුන් මුලිනුපුටා දැමීමේ හැකියාව බහුතර වැඩ කරන පංතියට ලබාදෙන මෙවලමක් ලෙස නීතිය භාවිතාවේ. වැඩ කරන ලෙස මිනිසුන්ට බලකිරීමේ, වැරදි කිරීම් සඳහා දඬුවම්දීමේ, ප්‍රතිවිප්ලවකාරීන් සහ වෙනත් විප්ලව විරෝධී ක්‍රියා විනාශ කිරීමේ, හා මගහැරිය නොහැකි කාරණයක් වන බෙදා හැරමේ යම් අසමතුලිතතාවයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව තවදුරටත් පවතිනු ඇත. එහෙයින් නීතිය වූකලි ආධිපත්‍යය පිළිබිඹු කරන මෙවලමකි..."

*[Jurisprudence – Fifth Edition by Diase , page- 398]*

ඉහත මතවාදය පිළිබඳව ඔබ එකග වන්නේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

06 නීතියෙහි ප්‍රාථමික කර්යය වන්නේ මානව ක්‍රියාකාරකම් සෞභාග්‍යමත් සහ සමෘද්ධිමත් බවට පත් කල හැකි ආකාරයේ ආරක්ෂිත සහ සමතුලිත පරිසරයක් නිර්මාණය කිරීම බව නීතිය පිළිබඳ සමාජ විද්‍යාත්මක ගුරු කුලයේ හරය වේ. දියුණුව සහතික කළ හැක්කේ සහ වර්ධනය කළ හැක්කේ මානව ක්‍රියාකාරකම්වලට බවත් නීතියේ එකම හා අනන්‍ය කාර්යය විය යුත්තේ මෙම ඉතා වැදගත් හැකියාව සඳහා යෝග්‍ය පරිසරය නිර්මාණය කිරීම බවත් යන තර්කයෙන් මෙම අදහස් ජනිත වේ.

ශ්‍රී ලංකාවේ තත්කාලීන නීතිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නීතියේ කියම කාර්යභාරය පිළිබඳව නිවැරදි චිත්‍රයක් ඉහත අදහස මගින් පිළිඹිබු කරන්නේද යන්න විවේචනාත්මකව විමසන්න.

07 ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනතාව සතු වන්නාවූ පරමාධිපත්‍ය බලය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව විසින්ම රජයේ අංග කිහිපයක් වෙත පවරාදෙන ලදි. රටේ ජනතාව වෙනුවෙන් පරමාධිපත්‍ය ක්‍රියාවට නැංවීම සඳහා මෙම රජයේ අංගවලට වරමක් තිබුනද, අධිකරණ විසින් සමහර අවස්ථාවන්හිදී, අධිකරණ අර්ථ නිරූපණ අනුසාරයෙන් ඉහත කී පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රකාශිතව හෝ නිශ්චිතව දක්වා නොමැති විවිධ වූ සීමා කිරීම් පනවා

ඇත. මෙකී සීමා කිරීම් රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා නීති දේහයේ නෛසර්ගික කොටසක් වන බවට කිසිදු සැකයක් නොමැත .

ඉහත අදහස තුල ගැබ්ව පවතින නීති විද්‍යාත්මක න්‍යාය හඳුනාගෙන වත්මන් ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා රාමුවේ සන්දර්භය තුළ එම න්‍යාය කොතෙක්දුරට ශ්‍රී ලංකාව සම්බන්ධව අදාළ කරගත හැකිදැයි සාකච්ඡා කරන්න.

08 **<u>එක්කෝ (අ) හෝ නැත්නම්(ආ) සඳහා පිළිතුරු සපයන්න.</u>**

(අ) සාමූහික සහ ඒකාකාරී පුරුදු සහ භාවිතයන් සිරිත් බවට පත්වන අතර සිරිත් ඒවායේ ප්‍රශස්ථ අවස්ථාවේදී බැඳ තබන සුළු සම්මතයන් නැතිනම් නියාමයන් බවට පත්වේ. මේ අනුව ගම්‍ය වන්නේ සමාජයේ අවනතභාවය නියෝග කරනු ලබන්නේ සහ බන්ධනීය චර්‍යාවන් ස්ථාපනය කරනු ලබන්නේ ඉහත දැක්වූ සම්මතයන් නැතිනම් නියාමයන් බවයි.

ඉහත අදහස පෝෂණය කරන්නාවූ න්‍යායෙහි දාර්ශනික පදනම් පිරික්සමින් සටහනක් ලියන්න.

(ආ) ස්කැන්ඩිනේවියානු තත්වාකාරවාදීහු ප්‍රධාන වශයෙන් නීති ක්‍රමයේ ගුණාංග කෙරෙහි සිය අවධානය යොමු කලහ. වියුක්ත සංකල්ප සහ න්‍යායන් තමන්ට දැඩි ලෙස නීරස බව ඔවුන් ප්‍රකාශ කලද, ස්කැන්ඩිනේවියානු තත්වාකාරවාදීහු අවසානයේදී නීතියෙහි ස්වභාවය ප්‍රමාණවත් ලෙස විස්තර කල හැකි එකම න්‍යාය ලෙස ඔවුන් විසින්ම හඳුන්වන ලද, තවත් එක් න්‍යායක් ඉදිරිපත් කලහ.

සාකච්ඡා කරන්න.

හිමිකම් ඇවිරිණි
************